සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 16 S I

**ඉස්ලාම්** | **කාලය පැය එකයි**

**උපදෙස් :-**
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ඇති ප්‍රශ්න සඳහා (i),(ii),(iii),(iv) අංක යෙදූ පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.
- මෙම ප්‍රශ්න සඳහා ලකුණු 40 යි.

01. නබි මුහම්මද් (සල්) තුමාට ප්‍රථමයෙන් පහළ වූ අල්කුර්ආන් වැකිය අඩංගු සූරාව,
i. සූරා ෆලක්. ii. සූරා ෆාතිහා. iii. සූරා අලක්. iv. සූරා යාසීන්.

02. ප්‍රථමයෙන් ඉස්ලාමය වැළඳගත් කාන්තාව වන්නේ,
i. ආමිනා. ii. කදීජා (රළි). iii. ෆාතිමා. iv. හෆ්සා (රළි).

03. "කුෆ්ර්" යන අරාබි පදයේ අර්ථය නොහඟවන පදයක් වනුයේ,
i. ප්‍රතික්ෂේප කිරීම. ii. පිටු දැකීම. iii. වැසීම. iv. බැහැර වීම.

04. කඃබාවේ ප්‍රථමයෙන් පිළිමයක් තැබුවේ,
i. අබුලහබ්. ii. මුසෙලමා. iii. අම්ර් ඉබ්නු ලුහෛ. iv. අබූ සුෆ්යාන්.

05. zසකාත් ලැබීමට සුදුසුකම් ලද අයගෙන් නිදහස ලද වහලුන් හඳුන්වන අරාබි පදය,
i. කාරිමුන්. ii. අර්රිකාබ්. iii. ඉබ්නු සබීල්. iv. ෆකීර්.

06. මදීනාවේ පැරණි නම,
i. තාඉෆ්. ii. බක්කා. iii. යත්රිබ්. iv. කුබා.

07. උපවාසයේ ප්‍රධාන සුන්නත් වලින් එකකි,
i. සහර් කිරීම. ii. නීය්යත් තැබීම. iii. නිදා ගැනීම. iv. දානමාන සිදු කිරීම.

08. අරෆා උපවාසය රකිනු ලබන දිනය,
i. දුල්හජ් 8 වන දින ii. මුහර්රම් 9 වන දින iii. මුහර්රම් 10 වන දින iv. දුල්හජ් 9 වන දින

09. විසඳුමක් නොලද ගැටළුවකට කුර්ආනය සහ හදීස් උපයෝගී කරගෙන විසඳුමකට එළඹීම හඳුන්වන පදය,
i. ඉල්හාම් ii. ඉජ්තිහාද් iii. උර්ෆ් iv. කරාමත්

10. ඉමාම් ෂාෆිඊ තුමාගේ අන්‍ය නාමය,
i. ඉමාමුල් මදීනා. ii. ඉමාමුල් අඃලම්. iii.ආලිමුල් කුරෛෂ්. iv. ඉමාමුල් මක්කා.

11. සවුදි අරාබි රාජ්‍ය අනුමැතිය ලද මද්හබය ලෙස ප්‍රකාශයට පත් කළ මද්හබය,
i. සාෆි මද්හබ් ii. හන්බලි මද්හබ් iii. හනෆි මද්හබ් iv. මාලිකි මද්හබ්

12. හුදෛබියා ගිවිසුම ඇති වූ වර්ෂය,
i. හිජ්රි 6. ii. හිජ්රි 8. iii. හිජ්රි 2. iv. හිජ්රි 10.

13. කුලෆාඋර් රාෂිදීන්වරුන්ගෙන් දීර්ඝ කාලයක් පාලනයෙහි යෙදී සිටියේ,
i. අබුබක්කර් (රළි). ii. උමර් (රළි). iii. උස්මාන් (රළි). iv. අලි (රළි).

14. "නෆ්සුල් ලව්වාමා" යනුවෙන් හඳුන්වන්නේ,
i. නිරෝගී හදවත. ii. අයහපතට පොළඹවන සිත. iii. තමාව රිදවා ගන්නා සිත. iv. තෘප්තිමත් සිත

15. රෝගීයෙකු මුණ ගැසුණු විට අප පැවසිය යුත්තේ,
i. මාෂා අල්ලාහ්. ii. බාරකල්ලාහු ලක. iii. අල්හම්දුලිල්ලාහ්. iv. ෂෆාකල්ලා.

16. ජම්උ තක්දීම් යනු,
i. පෙරටු කොට හා එක්කර ඉටු කිරීම. ii. එකතු කර ඉටු කිරීම.
iii. කෙටි කර ඉටු කිරීම. iv. පසු කර එකතු කර ඉටු කිරීම.

17. රමළාන් මාසයේ උපවාසයේ නිරත වූ හා නොවූ සියළු දෙනා විසින් ඉටු කළ යුතු අනිවාර්ය්‍ය වන අමලයක් වනුයේ,
i. zසකාතුල් ෆිත්ර්. ii. zසකාත්. iii. ඉෆ්තාර්. iv. උළ්හීය්යා.

18. අරාබි භාෂාව සෑම මුස්ලිම්වරයෙකුගේම නිවසේ භාවිත වන භාෂාව විය යුතු යැයි අපේක්ෂා කළ පුද්ගලයා,
   i. සිද්දි ලෙබ්බේ.   ii. ටී.බී. ජායා.   iii. ඒ.එල්.එම්. අබ්දුල් අසීස්.   iv. බාකිර් මාකාර්.

19. ප්‍රථමයෙන් හදීස් ග්‍රන්ථාරූඪ කිරීමේ වැයමේ යෙදුනු කලීෆා වරයා වනුයේ,
   i. උස්මාන් (රලි).  ii. උමර් ඉබ්නු අබ්දුල් අසීස්.   iii. උමර් ඉබ්නු කත්තාබ්.iv. මුආවියා.

20. නබි (සල්) තුමා මස්ජිදුල් හරාම් හි සිට මස්ජිදුල් අක්සාවට ගිය ගමන හඳුන්වනුයේ,
   i. හිජ්රත්.   ii. මිඃරාජ්.   iii. ඉස්රා.   iv. හජ්.

21. පහත (අ) කොටසේ ඉමාම්වරුන් ද, (ආ) කොටසේ ඔවුන් විසින් රචිත ග්‍රන්ථද සඳහන් කර ඇත.

| අ | ආ |
|---|---|
| 1. අබු හනීෆා (රහ්) | A . මුඅත්තා |
| 2. ෂාෆි (රහ්) | B.ෆික්හුල් අක්බර් |
| 3. මාලික් (රහ්) | C. අර්රිසාලා |

මෙහි (අ) කොටස පිළිවෙලින් සැකසූ විට නිවැරදි පිළිතුර වන්නේ,
   i. ACB .   ii. BCA.   iii. CAB.   iv. ABC.

22. නබි (සල්) තුමාගෙන් පසු මස්ජිදුල් අක්සාවේ නැමඳුම් කළ ප්‍රථම පුද්ගලයා,
   i. අබුබක්කර් (රලි).   ii. උමර් (රලි).   iii. උස්මාන් (රලි).   iv. අලි (රලි).

23. අල්කුර්ආනය කට පාඩම් කර ගත් අය කෙසේ හඳුන්වනු ලබන්නේද?
   i. කාරි.   ii. මුහද්දිස්.   iii. හාෆිල්.   iv. මුජ්තහිද්.

24. ඉස්රාඊල්වරුන් විසින් මස්ජිදුල් අක්සාව ගිනිබත් කළ වර්ෂය,
   i. 1924.   ii. 1937.   iii. 1967.   iv. 2000.

25. නබි (සල්) තුමා විසින් ශ්‍රී ලංකාවට යවන ලදැයි සඳහන් වන නබි මිතුරා වනුයේ,
   i. මුආද් ඉබ්නු ජබල් (රලි)   ii. මුස්අෆ් ඉබ්නු උමෛර් (රලි)
   iii. කාලිද් ඉබ්නු බකායා (රලි)   iv. වහබ් ඉබ්නු අබී හෆ්ස් (රලි)

26. "බුදූහුල් බුල්දාන්" යන ඉතිහාස ග්‍රන්ථයේ කතෘ,
   i. ඉබ්නු කල්දූන්.   ii. අල් බලාදූරි.   iii. ඉබ්නු සහ්යාර්.   iv. ඉබ්නු උමර්.

27. අල්මාඋල් මුස්තඃමල් යන පදයෙන් අදහස් වන්නේ,
   i. අධික ජලය.   ii. අල්ප ජලය.   iii. අපිරිසිදු ජලය.   iv. පරිහරණය කරන ලද ජලය.

28. "තස්කියතුන් නෆ්ස්" යනු
   i. ශාරීරික පාරිශුද්ධතාවය.   ii. චිත්ත පාරිශුද්ධතාවය.
   iii. නැමඳුම් කරන ස්ථානය පිරිසිදුව තිබීම.   iv. ඇඳුම් පිරිසිදුව තිබීම.

29. එකතු කර හා කෙටි කර ඉටු කළ නොහැකි සලාතය,
   i. අසර්   ii. මඃරිබ්   iii. ඉෂා   iv. සුබහ්

30. ද්‍රව්‍ය වලින් ඉටු කරනු ලබන ඉබාදතයකි,
   i. කලිමා.   ii. සලාතය.   iii. උපවාසය.   iv. zසකාත්.

31. උපවාසයෙන් අත්වන ලෞකික ප්‍රයෝජන වලින් එකකි,
   i. අල්ලාහ්ගේ තෘප්තිය ලැබීම.   ii. දුආ ප්‍රාර්ථනාවන් ඉටු වීම.
   iii. දුගීන්ට දානමාන සිදු කරන මනසක් ඇති වීම.   iv. පවු සමාව ලැබීම.

32. "අල් කිරාන්" යනු,
   i. හජ් පමණක් සිදු කිරීමට නීය්යත් තැබීම.   ii. හජ් සහ උම්රා සඳහා එකට නීය්යත් තැබීම.
   iii. හජ් සඳහා සහ උම්රා සඳහා වෙන වෙනම නීය්යත් තැබීම.   iv. උම්රා පමණක් ඉටු කිරීමට නීය්යත් තැබීම.

33. ක්‍රිස්තු වර්ෂ 636 දී පලස්තීනය ජයගත් අවස්ථාවේ දී කලීෆා ලෙස සිටියේ,
   i. අබුබක්කර් (රලි).   ii. උමර් (රලි).   iii. උස්මාන් (රලි).   iv. අලි (රලි).

34. ලෝකයේ වර්තමානයේ ඇති විශාලතම පල්ලිය කුමක්ද?
   i. කඃබතුල්ලාහ්.  ii. මස්ජිදුන් නබවි.   iii. මස්ජිදුල් කුබා.   iv. මස්ජිදුල් අක්සා.

35. ඉමාම් මුස්ලිම් උපන් වර්ෂය,
   i. හිජ්රි 194.   iii. හිජ්රි 207.   iii. හිජ්රි 209.   iv. හිජ්රි 204.

36. "සීරතු රසූලුල්ලාහ්" යන ග්‍රන්ථය ප්‍රථමයෙන් ලේඛන ගත කළේ,
   i. ඉබ්නු සඅද්.  ii. ඉබ්නු හිෂාම්.   iii. ඉබ්නු ඉස්හාක්.   iv. ඉබ්නු කසීර්.

37. පහත සඳහන් දේ අතුරින් ඊජාබ් - කබූල් නොමැතිව සිදු කළ නොහැකි කාර්යයන්,
i. විවාහය, දික්කසාදය. ii. ව්‍යාපාරය හා ඉද්දාව.
iii. දික්කසාදය, ව්‍යාපාරය. iv. ව්‍යාපාරය සහ විවාහය.

38. ඉස්ලාමීය ආර්ථික න්‍යායේ ප්‍රධාන කරුණ,
i. සම්පත් සියල්ල අල්ලාහ්ට අයත්ය. ii. සම්පත් උපයා ගත් අයටම අයත්ය.
iii. zසකාත්, සදකා ධනවත් අයට අනිවාර්‍යය වේ. iv. වස්තූන් අපව පරීක්ෂාවට ලක් කිරීමකි.

39. බිරිඳ, සැමියාගෙන් විවාහ බන්ධනයෙන් නිදහස ඉල්ලා සැමියාට වන්දියක් ලබා දී විවාහ බන්ධනයෙන් නිදහස් වීම,
i. තලාක්. ii. කුල් උ. iii. ෆස්හ්. iv. ලිආන්.

40. පරිසරය පිරිසිදුව තබා ගැනීමත් භූමිය සශ්‍රීක කිරීමත්,
i. කිලාෆත් වගකීමකි. ii. ඉබාදත් වගකීමකි. iii. ඉමාරත් වගකීමකි. iv. ඉරාදත් වගකීමකි.

කාලය පැය දෙකයි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක්ද අනෙකුත් තෝරා ගන්නා ප්‍රශ්නයන් සඳහා ලකුණු 10 බැගින් වශයෙන් පිරිනමනු ලැබේ.**

01. **කෙටි පිළිතුරු ලියන්න.**

(i) ඊමානයට හානි පමුණුවන කරුණු හතරක් ලියන්න.
(ii) උපවාසයේ ෆර්ලු මොනවාද?
(iii) අත්තහ්යාත් හිඳුම් දෙක කුමක්ද?
(iv) උස්මාන් (රලි) තුමාගේ ගෞරව නාම දෙකක් ලියන්න.
(v) ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට එළි දැක්වුණු ඉස්ලාමීය පුවත්පත් දෙකක නම් ලියන්න.
(vi) ශ්‍රී ලංකාවේ නිදහස් සටනට උරදුන් මුස්ලිම් නායකයින් දෙදෙනෙකුගේ නම් ලියන්න.
(vii) ඉබ්රාහීම් (අලෛ) සලාම් විසින් ඉදි කරන ලද පල්ලි දෙක කුමක්ද?
(viii) ඉස්ලාමීය අකීදාවේ ප්‍රධාන මූලාශ්‍ර දෙක කුමක්ද?
(ix) සලාතයේ පාරායණය මඟින් සිදු කරනු ලබන ෆර්ලු දෙක කුමක්ද?
(x) අස්සිහාහුස් සිත්තා හි කතෘවරු හතර දෙනෙකුගේ නම් ලියන්න.

02. (i) වහී හි වර්ග මොනවාද?
(ii) වහී පහළ කරනු ලැබූ ක්‍රම තුනක් සඳහන් කරන්න.
(iii) වහී හි වැදගත්කම ගෙන හැර දක්වන කාරණා පහක් ලියන්න.

03. (i) ෂිර්කුල් අක්බර් හි අඩංගු කරුණු දෙකක් ලියන්න
(ii) කුෆ්රි හි වර්ග තුන ලියන්න
(iii) මුර්තද් පිළිබඳ ඉස්ලාම් පවසන අදහස් පහක් ලියන්න

04. (i) කලීෆා අබුබක්කර් (රලි) තුමාගේ පාලන කාලයේදී මුහුණ දුන් ප්‍රධාන ගැටළු දෙකක් ලියන්න
(ii) දන්දීම මඟින් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න
(iii) හුදෛබියා ගිවිසුම පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

05. (i) ඉද්දා හි වර්ග මොනවාද?
(ii) විවාහයක් අනුමත වීමට අවශ්‍ය කොන්දේසි මොනවාද?
(iii) දික්කසාද වර්ග කෙටියෙන් හඳුන්වන්න

06. (i) කියාස් යනු කුමක්ද?
(ii) ජලයේ වර්ග සඳහන් කර ඒවාට උදාහරණයක් බැගින් ලියන්න
(iii) දෙමවුපියන් දරුවන්ට කළ යුතු යුතුකම් පහක් ලියන්න

07. පහත සඳහන් මාතෘකා වලින් මාතෘකා දෙකක් පිළිබඳව විස්තරාත්මක සටහන් ලියන්න
(i) කලීෆා උස්මාන් (රලි).
(ii) තවුබා.
(iii) ඉජ්මා.
(iv) ටී.බී. ජායා.



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON
DELIVERY
HOME
DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via
WhatsApp
071 777 4440